කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2694846
: 011 2694847 Ext -804/805
Fax : 011 2698311
E-mail : agromet12@yahoo.com
Web : www.meteo.gov.lk
: https://www.facebook.com/SLMetDept/

Agro meteorological Bulletin - කෘෂි කාලගුණ තොරතුරු ප්‍රකාශය

Vol: 07-2021 **07 වන සතිය** **07th Week**

පෙබරවාරි 05 සිට පෙබරවාරි 11 දක්වා සතිය තුල පැවති කාලගුණ තත්වයේ සාරාංශය:



රූපය 01
පෙබරවාරි 05 සිට පෙබරවාරි 11 දක්වා සතිය තුල වාර්තාවූ මුළු වර්ෂාපතනය(මි.මී)

- පැය 24 ක් තුල වාර්තා වූ වැඩිම වර්ෂාපතනය වන මි.මී 87.5 මීගහතැන්න (කළුතර) ප්‍රදේශයෙන්, පෙබරවාරි 08 වන දින වාර්තා විය.
- උපරිම උෂ්ණත්වයේ සාමාන්‍යය අගයයට වඩා වැඩිවීමේ වැඩිම අගය සෙල්සියස් අංශක 3.2 ක් වූ අතර, එය පෙබරවාරි 07 වන දා සෙල්සියස් අංශක 33.4 ලෙස හම්බන්තොට ප්‍රදේශයෙන් වාර්තාවිය.
- අවම උෂ්ණත්වයේ සාමාන්‍යය අගයයට වඩා අඩු වීමේ පහලම අගය සෙල්සියස් අංශක 4.1 ක් වූ අතර, එය පෙබරවාරි 11 වන දා සෙල්සියස් අංශක 18.5 ලෙස යාපනය ප්‍රදේශයෙන් වාර්තාවිය.

ඇතුලත:

පසුගිය සතිය තුල පැවති කාලගුණ තත්වය

වර්ෂාපතනය
- වැඩිම වර්ෂාපතනයන් පි. 02
- වර්ෂාපතනයේ වෙනස්වීම පි. 02
- වර්ෂාපතනයේ වෙනස්වීමේ ප්‍රතිශතය පි. 03
- සමුච්චිත වර්ෂාපතනයේ හැසිරීම පි. 04

උෂ්ණත්වය
- උපරිම උෂ්ණත්වයේ වැඩිවීම පි. 07
- උපරිම උෂ්ණත්වයේ අඩුවීම පි. 07
- අවම උෂ්ණත්වයේ වැඩිවීම පි. 08
- අවම උෂ්ණත්වයේ අඩුවීම පි. 08
- පසුගිය සතිය තුල උපරිම/අවම පි. 09
- උපරිම/අවම උෂ්ණත්ව සාමාන්‍යයන් පි. 09

පාංශු ජලය පි. 10

කෘෂි කාලගුණ පරාමිතීන් හි සති සාමාන්‍යයන් පි. 11

ඉදිරි සතිය සඳහා කාලගුණ අනාවැකිය පි. 13

ඉදිරි දින 20 සඳහා පස් දින කාලය තුල ලැබිය හැකි වර්ෂාපතන අගයන්හි වෙනස්වීම පි. 15

කෘෂි කාලගුණ අංශය
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත
කොළඹ 07

Agromet Division
Department of Meteorology
383, Baudhaloka Mawatha
Colombo 07

පසුගිය සතිය තුළ පැවති කාලගුණය

1. වර්ෂාපතනය

05 වන දින ප්‍රධාන වශයෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශවල වැසි රහිත කාලගුණ තත්වයක් ද, 06 වන දින මඩකලපුව, අම්පාර, ගාල්ල, මාතර, කළුතර සහ රත්නපුරය යන දිස්ත්‍රික්කවල ප්‍රදේශ බොහොමයක සාමාන්‍ය තද වැසිද, 07 සහ 08 වන දින වල මඩකලපුව, බදුල්ල, කළුතර, රත්නපුරය සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල ප්‍රදේශ කීපයක සාමාන්‍ය තද වැසිද, 09 වන දිනෙන් පසු නැවත දිවයින පුරා වැසි රහිත කාලගුණ තත්වයක් ද වාර්තා වී ඇත.

දිනය	වර්ෂාපතනය (මි.මී)	ප්‍රදේශය
2021-02-05	35.0	බද්දේගම
2021-02-06	55.0	ආබර්වැලි වතුයාය (මාතර)
2021-02-07	68.0	උන්නිච්චෙයි (මඩකලපුව)
2021-02-08	87.5	මීගහතැන්න (කළුතර)
2021-02-09	5.0	ගෝනපිටිය (නුවරඑළිය)
2021-02-10	1.0	දෙනියාය
2021-02-11	9.1	බටුවන්ගල (ගාල්ල)

වගුව 01- දිනපතා වාර්තාවූ උපරිම වර්ෂාපතනය පිළිබඳ විස්තර

2. වර්ෂාපතනයේ වෙනස්වීම (Anomaly)



2 වන රූපය. 2021 ජනවාරි 01 සිට 2021 පෙබරවාරි 11 දක්වා වර්ෂාපතනය, සාමාන්‍යය (1961-1990) වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස

3 වන රූපය. 06 වන සතිය තුළ ලැබුණු වර්ෂාපතනය එම සතිය තුල සාමාන්‍යය (1961-1990) වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස

2 වන රූප සටහන මගින් 2021 ජනවාරි 01 සිට පෙබරවාරි 11 දක්වා වර්ෂාපතනය, සාමාන්‍යය වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස දක්වා ඇත. වසරේ මුල සිට වාර්ෂික වර්ෂාපතන එකතුව සාමාන්‍යය අගයයන්(1961-1990) සමග සැසඳීමේදී බදුල්ල සහ මහනුවර දිස්ත්‍රික්ක වල දී 1% - 11% ත් අතර වැඩිවීමක් හැර සෙසු සියලුම දිස්ත්‍රික්ක වල දී විශේෂයෙන් නුවරඑළිය, අම්පාර, පුත්තලම, කොළඹ, රත්නපුරය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලදී 25% - 100% ත් අතර ද, අනිත් සියලුම දිස්ත්‍රික්ක වලදී 100% - 300% ත් අතර වැඩි වීමක් ද දැකිය හැක.

3 වන රූප සටහන මගින් 06 වන සතිය තුළ ලැබුණු වර්ෂාපතන අගයයන් එම සතිය තුල සාමාන්‍යය වර්ෂාපතන අගයයන්ට (1961-1990) වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස පෙන්වා ඇත. සතියේ වර්ෂාපතන අගයයන්, සාමාන්‍යය අගයයන් සමග සැසඳීමේදී මාතලේ, ගාල්ල සහ රත්නපුරය යන දිස්ත්‍රික්ක වලදී 6% - 13% ත් අතර වැඩිවීමක්ද, අම්පාර දිස්ත්‍රික්කයේදී 123% ක වැඩිවීමක්ද, හැර සෙසු සියලුම දිස්ත්‍රික්ක වලදී 26% - 100% ත් අතර අඩුවීමක්ද දැක්වේ.

3. වර්ෂාපතනයේ වෙනස්වීමේ ප්‍රතිශතය

දිස්ත්‍රික්කය	වර්ෂාපතනය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස	වර්ෂාපතනය අඩුවීම ප්‍රතිශතයක් ලෙස
යාපනය	239.0%	-
මන්නාරම	203.0%	-
වවුනියාව	138.0%	-
අනුරාධපුරය	168.0%	-
ත්‍රිකුණාමලය	110.0%	-
පුත්තලම	93.0%	-
පොළොන්නරුව	181.0%	-
කුරුණෑගල	103.0%	-
මාතලේ	124.0%	-
මඩකලපුව	206.0%	-
අම්පාර	75.0%	-
මහනුවර		11.0%
කෑගල්ල	305.0%	-
නුවරඑළිය	25.0%	-
බදුල්ල		1.5%
ගම්පහ	110.0%	-
කොළඹ	95.0%	-
කළුතර	165.0%	-
ගාල්ල	146.0%	-
මාතර	-	-
රත්නපුර	87.0%	-
හම්බන්තොට	35.0%	-
මොණරාගල	-	-

වගුව 3. 2021 ජනවාරි 1 සිට පෙබරවාරි 11 දක්වා වාර්තා වූ මු වර්ෂාපතනය, සාමාන්‍යයය වර්ෂාපතනය (1961-1990 සාමාන්‍යයය) සමග වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස (2 රූපය)

දිස්ත්‍රික්කය	වර්ෂාපතනය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස	වර්ෂාපතනය අඩුවීම ප්‍රතිශතයක් ලෙස
යාපනය	-	100.0%
මන්නාරම	-	100.0%
වවුනියාව	-	100.0%
අනුරාධපුරය	-	75.0%
ත්‍රිකුණාමලය	-	100.0%
පුත්තලම	-	96.0%
පොළොන්නරුව	-	98.0%
කුරුණෑගල	-	86.0%
මාතලේ	-	41.0%
මඩකලපුව	13.0%	-
අම්පාර	123.0%	-
මහනුවර	-	79.0%
කෑගල්ල	-	34.0%
නුවරඑළිය	-	57.0%
බදුල්ල	-	34.0%
ගම්පහ	-	100.0%
කොළඹ	-	99.0%
කළුතර	-	26.0%
ගාල්ල	8.7%	-
මාතර	-	-
රත්නපුර	6.2%	-
හම්බන්තොට	-	83.0%
මොණරාගල	-	-

වගුව 4. 06 වන සතිය තුල (පෙබරවාරි 05 සිට පෙබරවාරි 11 දක්වා) වර්ෂාපතනය සති සාමාන්‍යයය වර්ෂාපතනය (1961-1990 සාමාන්‍යයය) සමග වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස (3 රූපය)

4. 2021 ජනවාරි 1 සිට පෙබරවාරි 11 දක්වා වර්ෂාපතනය සමුච්චිත (Cumulative) හැසිරීම.

එක් එක් දිස්ත්‍රික්කයේ 2021 ජනවාරි 1 සිට පෙබරවාරි 11 දක්වා සමුච්චිත වර්ෂාපතනය සහ සාමාන්‍යය සමුච්චිත වර්ෂාපතනය (1961-1990) පහත රූප සටහන් මගින් පෙන්නුම් කෙරේ.














Kegalle
Rainfall (mm)
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Ratnapura
Rainfall (mm)
3500.0
3000.0
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Kandy
Rainfall (mm)
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Matale
Rainfall (mm)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Nuwara Eliya
Rainfall (mm)
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Badulla
Rainfall (mm)
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Ampara
Rainfall (mm)
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Batticoloa
Rainfall (mm)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Trincomalee
Rainfall (mm)
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Anuradhapura
Rainfall (mm)
1200.0
1000.0
800.0
600.0
400.0
200.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Polonnaruwa
Rainfall (mm)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Vauniya
Rainfall (mm)
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Jaffna
Rainfall (mm)
1400.0
1200.0
1000.0
800.0
600.0
400.0
200.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Mannar
Rainfall (mm)
1000.0
800.0
600.0
400.0
200.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Puttalam
Rainfall (mm)
1400.0
1200.0
1000.0
800.0
600.0
400.0
200.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks


Kurunegala
Rainfall (mm)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 5 9 13 17 21 25 29 33 37 41 45 49
Agromet Weeks

4. 06 වන සතිය තුල (පෙබරවාරි 05 සිට පෙබරවාරි 11 දක්වා) උපරිම උෂ්ණත්වයේ හැසිරීම

06 වන සතිය තුල උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන් (1961-1990) සමග වාර්තා වූ වෙනස පහත පරිදි වේ.

4.1 උපරිම උෂ්ණත්වයේ වැඩිවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය වෙනස්වූ ඒකක ගණන (^0C)	සතිය තුල එම තත්වය පැවති දින ගණන
හම්බන්තොට	2 – 3	05
රත්මලාන	2 – 3	03
කොළඹ	2 – 3	01

වගුව 02. සතියේ උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා වැඩිවූ අංශක ගණන සහ සතිය තුල එම වැඩිවීම පැවති දින ගණන

සතියේ උපරිම උෂ්ණත්ව අගයයන්, ඒවායේ සාමාන්‍යය අගයයන්(1961- 1990) සමග සැසඳීමේදී උපරිම උෂ්ණත්වයේ වැඩිවීම, වගු අංක 02 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 2 - 3 ත් අතර අගයයක්ගත් අතර, හම්බන්තොට කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේදී එම වැඩිවීම දින 05 කදී වාර්තාවී ඇත. එලෙසම එම අගයයන්ගේම අඩුවීම වගු අංක 03 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවලදී සෙන්ටිග්‍රේඩ් අංශක 2 - 5 ත් අතර අගයයක් ගත් අතර, බදුල්ල, මහඉලුප්පල්ලම සහ අනුරාධපුරය යන කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී එම අඩුවීම පිලිවෙලින් දින 7ක් , 6ක් සහ 5 කදී වාර්තා විය.

4.2 උපරිම උෂ්ණත්වයේ අඩුවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය අඩුවූ අංශක ගණන (^0C)	සතිය තුල එම අඩුවීම පැවති දින ගණන
බදුල්ල	2 - 5	07
මහඉලුප්පල්ලම	2 - 5	06
අනුරාධපුරය	2 - 5	05
බණ්ඩාරවෙල, කටුගස්තොට රත්නපුරය	2 - 5	03
කුරුණෑගල, නුවරඑළිය පුත්තලම	2 - 5	02

වගුව 03. ප්‍රධාන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල සතියේ උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා අඩුවූ අංශක ගණන සහ සතිය තුල එම අඩුවීම පැවති දින ගණන

5. 06 වන සතිය තුල (පෙබරවාරි 05 සිට පෙබරවාරි 11 දක්වා) අවම උෂ්ණත්වයේ හැසිරීම.

06 වන සතිය තුල අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන් (1961-1990) සමග ඇති වෙනස පහත පරිදි වේ.

5.1 අවම උෂ්ණත්වයේ වැඩිවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය වැඩිවූ අංශක ගණන (^0C)	සතිය තුල එම වැඩිවීම පැවති දින ගණන
බණ්ඩාරවෙල, රත්මලාන	2 – 3	04
වව්නියාව	2 – 3	03
බදුල්ල, කොළඹ, කටුගස්තොට කටුනායක, කුරුණෑගල, මහඉලුප්පල්ලම, මන්නාරම	2 – 3	02
අනුරාධපුරය, මඩකලපුව, හම්බන්තොට, යාපනය, නුවරඑළිය.	2 – 3	01

වගුව **04.** ප්‍රධාන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා වැඩිවූ ඒකක ගණන සහ සතිය තුල එම වැඩි වීම පැවති දින ගණන

සතියේ අවම උෂ්ණත්ව අගයයන්, ඒවායේ සාමාන්‍යය අගයයන්(1961- 1990) සමග සැසඳීමේදී,අවම උෂ්ණත්වයේ වැඩිවීම,වගු අංක 04 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 2 - 3 ත් අතර අගයයක් ගත් අතර, බණ්ඩාරවෙල සහ රත්මලාන යන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවලදී එම වැඩිවීම දින 4 කදී වාර්තාවී ඇත. එලෙසින්ම එම අගයයන්ගේම අඩුවීම වගු අංක 05 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවලදී සෙන්ටිග්‍රේඩ් අංශක 2 - 4 ත් අතර අගයයක් ගත් අතර, යාපනය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේදී එම අඩුවීම දින 4කදී වාර්තාවී ඇත.

5.2 අවම උෂ්ණත්වයේ අඩුවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය අඩුවූ අංශක ගණන (^0C)	සතිය තුල එම අඩුවීම පැවති දින ගණන
යාපනය.	2 – 4	04
මහඉලුප්පල්ලම, නුවරඑළිය පුත්තලම	2 – 4	03
කටුනායක, ත්‍රිකුණාමලය වව්නියාව.	2 – 4	02
අනුරාධපුරය.	2 – 4	01

වගුව **05.** අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා අඩුවූ අංශක ගණන සහ සතිය තුල එම අඩුවීම පැවති දින ගණන

6. 06 වන සතිය තුල උපරිම සහ අවම උෂ්ණත්වයන්හි ඉහළම වැඩිවීම් හා පහළම අඩුවීම්

		දිනය	ප්‍රදේශය	අංශක ගණන (^{0}C)	වාර්තා වූ උෂ්ණත්වය (^{0}C)
උපරිම උෂ්ණත්වය	ඉහළම වැඩිවීම	2021-02-07	හම්බන්තොට	3.2	33.4
	පහළම අඩුවීම	2021-02-08	බදුල්ල	5.3	21.5
අවම උෂ්ණත්වය	ඉහළම වැඩිවීම	2021-02-06	බණ්ඩාරවෙල	3.5	17.1
	පහළම අඩුවීම	2021-02-11	යාපනය	4.1	18.5

7. 06 වන සතියේ සාමාන්‍යය උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වයන් එහි සති සාමාන්‍යය **(1961-1990,30 Year Average)** සමග ඇති වෙනස



රූපය 4



රූපය 5

4 වන රූපය මගින් උපරිම උෂ්ණත්වය වෙනස් වීම හා **5** වන රූපය මගින් අවම උෂ්ණත්වය වෙනස් වීම එහි සති සාමාන්‍යය **(1961-1990,30 Year Average)** සමග ඇති වෙනස පෙන්නුම් කරයි.

8. පොළොව තුල එක් එක් මට්ටම්වල පැවති පාංශු ජල ප්‍රමාණයයන්

පොළොව තුල එක් එක් මට්ටම් වල පැවති පාංශු ජල ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස පහත රූප සටහන් වලින් දක්වා ඇත.



රූපය 06 පොළොව මට්ටමේ සිට සෙ.මී. 10 ක් දක්වා වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 07 පොළොව මට්ටමේ සිට සෙ.මී. 10 .ත් සෙ.මී. 40 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 08 පොළොව මට්ටමේ සිට සෙ.මී. 40 ත් සෙ.මී. 100 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.

පාංශු ජල ප්‍රමාණය ගණනය කරන ලද මට්ටම් 3 දීම අනුරාධපුර, කුරුණෑගල සහ මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රදේශ බොහෝමයක පහළ අගයයකුත්, අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක ඉහළ අගයයකුත්, මධ්‍යම පළාත තුළදීත් මාතලේ සහ රත්නපුර දිස්ත්‍රික්ක වල ප්‍රදේශ බොහොමයකදීත්, සාමාන්‍ය අගයයකුත් ගනී.

9. කෘෂි කාලගුණ තත්ත්වය පිළිබඳ සති සාමාන්‍යයන්,

2003-2007 වසර වල පවතින දත්ත වලට අනුව පහත සාමාන්‍යය අගයන් ගණනය කර ඇත.



වාෂ්පීභවනය - මිමී/දින (Evaporation) mm/day



වර්ෂාපතනය - මිමී (Rainfall) mm



සාපේක්ෂ ආර්ද්‍රතාව 0830h- (Relative Humidity) %



සාපේක්ෂ ආර්ද්‍රතාව 1530h- (Relative Humidity)%



උපරිම උෂ්ණත්වය - සෙල්සියස් අංශක
(Maximum Temperature) - C^0



අවම උෂ්ණත්වය - සෙල්සියස් අංශක
(Minimum Temperature) - C^0



සූර්ය දීප්ත පැය ගණන
(Sunshine Hours)

10. ඉදිරි දින 7 සඳහා කාලගුණ අනාවැකිය,

10.1 2021 පෙබරවාරි 13 දින පෙ.ව 05.30 සිට පෙබරවාරි 20 දින පෙ.ව 05.30 දක්වා දෛනික වර්ෂාපතන අනාවැකිය.

(ECMWF (2021-02-12 වන දින දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලද).



2021-02-13 පෙ.ව 05.30 සිට 2021-02-14 පෙ.ව 05.30 දක්වා



2021-02-14 පෙ.ව 05.30 සිට 2021-02-15 පෙ.ව 05.30 දක්වා



2021-02-15 පෙ.ව 05.30 සිට 2021-02-16 පෙ.ව 05.30 දක්වා



2021-02-16 පෙ.ව 05.30 සිට 2021-02-17 පෙ.ව 05.30 දක්වා



2021-02-17 පෙ.ව 05.30 සිට 2021-02-18 පෙ.ව 05.30 දක්වා



2021-02-18 පෙ.ව 05.30 සිට 2021-02-19 පෙ.ව 05.30 දක්වා



2021-02-19 පෙ.ව 05.30 සිට 2021-02-20 පෙ.ව 05.30 දක්වා

ඉදිරි සතිය පුරාම ප්‍රධාන වශයෙන් දිවයින ආශ්‍රිතව වැසි රහිත කාලගුණ තත්වයක් අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත් 19 දින වන විට මේතත්වයේ වෙනස් වීමක් අපේක්ෂා කරන අතර දිවයිනේ නිරිත දිග ප්‍රදේශ, වයඹ හා උතුරු මැද ප්‍රදේශයන්හි තැනින් තැන ගිගුරුම් සහිත වැසි ඇතිවීමේ හැකියාවක් පවතී.

10.2 ඉදිරි සතිය තුල ලැබිය හැකි වර්ෂාපතනය පිළිබඳ අනාවැකිය.



රූපය 09 සතිය තුල ලැබෙන වර්ෂාපතනය



රූපය 10. සාමාන්‍යයයන් (1961-1990) සමඟ වෙනස් වීම (Rainfall Anomaly)

උපුටා ගැනීම: INDIAN INSTITUTE OF TROPICAL METEOROLOGY, PUNE, INDIA

රූපය 09 ට අනුව පෙබරවාරි 12-18 සතිය තුල දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ හැකියාවක් පවතින බව පෙන්නුම් කරන අතර, එය එම කාලයේ සාමාන්‍ය වර්ෂාපතනය සමග සැසඳීමේදී නැගෙනහිර ප්‍රදේශ වලදී වැඩි අගයක් ගන්නා බව 10 රූපයට අනුව පෙන්නුම් කරයි.
කෙසේ වෙතත් මෙම වැසි තත්වය පෙබරවාරි 19- මාර්තු 4 කාලය තුල අඩුවීමක් පෙනන්නුම් කරන අතර, නැවතත් මාර්තු 05 -11 කාලය තුල වැඩිවීමක් පෙන්නුම් කරයි.